# ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය (මාඕවාදී)

## සිරියාව වැරදිකරුවෙක් නම්, මන්මෝහන් සින් අපරාධකරුවෙකි!

## සිය රටවැසියන්ට එරෙහිව රසායනික අවි භාවිතා කළ මන්මෝහන් සින් ට දඬුවම් කරනු!!



රසායනික අවි භාවිතා කළ නිසා සිරියාවට පහර දීමට ඇමෙරිකාව කිසිදු අකමැත්තක් නොපෙන්වන අතර ජේන විදියට දැඩි කැදරකමකින් සිටී. සමහර යුරෝපීය රටවල් එහි ගෝලීය ප්‍රචාරක කටයුතු පිටුපස සිටියහ. ඉන්දීය අගමැති මන්මෝහන් සින් රසායනික අවි භාවිතයට එරෙහිව ඇමෙරිකාවට සිය සහය දුන් නමුදු ප්‍රහාරය ගැන දැඩි ලෙස සිතා බැලිය යුතුයැයි රුසියාව සමග නැගී සිටියහ. එලෙසම කිසිදු අකමැත්තකින් තොරව සිය රටවැසියන්ට එරෙහිව රසායනික අවි භාවිතා කළ මන් මෝහන් සින් රසායනික අවි භාවිතයට එරෙහිව කථා කළහ. සිරියාවේ අෂාඩ් රජය වැරදිකරු නම් මන්මෝහන් සින් දඬුවම් ලැබීමට සුදුස්සෙකු වේ. මූලිකවම පීඩිත ජනතාව අධිරාජ්‍යවාදීන්ගේ කොම්ප්‍රදෝරු පාලනය කිසිදු පිළිනොගන්නා අතර එය ඉදිකොට තිබෙන ඇති බැවින් එයට එරෙහිව අරගලයක නිරත වෙමින් සිටී. දීප ව්‍යාප්ත මහජන ව්‍යාපාර ගණනාවක් සමග ජනතාව මේ උරුමය නොපිරිහෙලා ඉදිරියට ගෙන යනු ලැබේ.

මේ මහජන ව්‍යාපාර, දැනට තිරසර උපායශීලීත්වයකින් යුතුව නව ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය ඉදිකිරීමේ අරමුණ ඇතිව ඉදිරියට යමින් සිටී. තීව්‍ර ෆැසිස්ට් මර්ධනය අතරතුරදී ව්‍යාපාරය ජීවමානව පවත්වාගැනීමට ඒවා දරාගනිමින්, සන්නද්ධ අරගලය හැර වෙන විකල්පයක් නොමැති බව ජනතාව අවබෝධ කරගෙන තිබේ. ඉන්දීය ජනතාව මේ ආකාරයේ වූ අරගලය පිළිගෙන තිබෙන බැවින් පසුගිය 44 වසර තිස්සේ මේ අරගලය ජනතාවගේ හදගැස්ම ලෙස ඉදිරියට ගෙන යමින් සිටියි. ආරම්භයේ සිටම ඉන්දීය රජය ජනතාව දරුණු ලෙස මර්ධනය කළද ඔවුන්ට විප්ලවීය ව්‍යාපාරය කිසිකලෙක මැඩලිය නොහැකි විය. උමතු රජය රසායනික අවි භාවිතා කරන්නට පටන් ගෙන තිබෙන අතර කිහිප දෙනෙකු මරා දමනු ලැබූ, ගාච්රෝලි (Garhchiroli) පොලීසිය විසින් මේ වසරේ විප්ලවීය ජනතාවට එරෙහිව විශාල පරිමාණයෙන් දියත් කළ ඒකපාර්ශ්වික ප්‍රහාරයන් ගැන සාක්ෂි මෑතකදී හමුවී ඇත. දැන්, ජාත්‍යන්තර නීතියට අනුව ඔබාමා මන්මෝහන් සින් ට සහ ඔහුගේ රජයට දඬුවම් කිරීමට ඉදිරිපත් වෙයිද?

මාඕවාදීහු මේ රටේ පුරවැසියන් වෙති. ගාච්රෝලි ආදිවාසී ජනතාවද මේ රටේ පුරවැසියන් වෙති. මන්මෝහන් සින් නායකත්වය දෙන එක්සත් ප්‍රගතිශීලී සන්ධාන (UPA-2) රජය හරිත දඩයම් මෙහෙයුම යන නමින් ඉන්දියාවේ ජනතාවට එරෙහිව යුද්ධයක නිරත වෙමින් සිටී. මාඕවාදියෙකු වුවද නොවූවද, ග්‍රාමීය හෝ නාගරික ප්‍රදේශයක, මහජන අරගලය හෝ සන්නද්ධ අරගලය, නිරාහාර උපවාසයක් හෝ ඉටි පහන් රැගත් පෙරහරක් යන මේ කොයිකත්, සරල ප්‍රකාශනයක් හෝ විවේචක කාටූනයක් යන මේ කොයිකත්, කිසි කලෙක රජය විසින් නොඉවසන ලදි. රජයට එරෙහි අදහසක් ඔබේ සිත තුළ ජනිතවන්නේ නම් එයත් රටට එරෙහි තර්ජනයකි. එය මන්මෝහන් සින් විසින් පාරට්ටු බාන ලෝකයේ තිබෙන විශාල ප්‍රජාතන්ත්‍රවාදී රජයයි. ඔවුන්ට අනුව ප්‍රජාතන්ත්‍රවාදයේ අර්ථය කුමක්ද? ඔවුහු ඔබට මගපෙන්වීමක් ලබාදී අවසානයේ පෙන්වීමට පමණක් සැලසුම් කරන ලද විරුද්ධත්වයක් නැගීමට ඉඩ දේ, එය ඔවුන්ගේ පාලනය තුළ හොඳින් පවතින අතර ඔවුහු ඒ අටපට්ටම් විරුද්ධත්වය ප්‍රජාතන්ත්‍රවාදයේ අකෘතිය ලෙස ප්‍රදර්ශනය කරයි. දින කිහිපයකින් පසු මේ විරුද්ධවාදීන් අමාත්‍යවරයෙකු හෝ මහන්දමාල් (mahamandal) සභාපතිවරයෙකු හෝ අධ්‍යාපන ආයතනයක හිමිකරුවෙකු, කිසිදු ඇපයක් නැතිව කෝටිපතියෙකු හෝ කීර්තිමත් ගෞරවනීය සම්මානලාභී සමාජ සේවකයෙකු බවට බවට පත්වේ. මේ ක්‍රීඩාවෙහි ඔවුන් නියැලෙන අතරතුර ඔවුහු ජනතාවගේ දුප්පත්කම සහ අනෙකුත් එවැනි ප්‍රශ්න විශාල ලෙස භාවිතා කරයි. අයෙකුට ගාච්රෝලි දිස්ත්‍රික්කයේ සම්මානලාභී සමාජ සේවකයින් වැඩිවෙනු දක්නට ලැබෙයි. සමාජ සේවකයින් යැයි හඳුන්වනු ලබන මොවුන්ගේ දෑස් ඉදිරිපිටදීම, ආදිවාසීන් මරා දැමෙන අතර ඔවුහු ඒ වෙනුවෙන් කිසිවක් නොකරති. ඔවුන්ගේ කටවල් රජයේ මුදල් වලින් අගුළු ලා ඇත.

පසුගිය අට මස තුළ පොලීසිය විසින් මරා දැමුණු සියළුම මිනිසුන් ආදිවාසීන් වූහ. ගාච්රෝලි වලදී එය හරිත දඩයම් මෙහෙයුම පැහැරීමේ ව්‍යාපාරයක් පමණි. රයිෆල් වෙඩි තබමින් දිව ගිය ඔවුහු දැන් රසායනික අවි

භාවිතා කරමින් ආදිවාසීන් මරා දමන්නට පටන් ගෙන ඇත. මේ මගින්, මෙය රජයේ පරාජය පිළිබඳ සංඥාව බව ඉතා පැහැදිලි වේ. අප්‍රේල් 12 වන දින, ගාච්රෝලි දිස්ත්‍රික්කයේ ධානෝරා තාලුක් හි සින්දෙසූර් ගමේ පොලීසිය විසින් කුමන්ත්‍රණය කළ ගැටුමින් මිනිසුන් 7 දෙනෙකු දිවි පිදූහ, මිය ගිය අය අතර ගම්වැසියන් දෙදෙනෙකු හා මහජන සංවිධාන ක්‍රියාකාරිකයින් 5 දෙනෙකු විය. වෙඩි උණ්ඩ නිසා මියගිය පස් දෙනෙකු ඔවුනතර වුවද දෙදෙනෙකු ට කිසිදු මූනිස්සම් තුවාලයක සලකුණක් හො නොතිබුණු බව සොයා ගන්නා ලදි. මේ දෙදෙනා අතර ගම්වැසියෙකු වන මුකේෂ් සහ සහෝදර චම්පා විය, ඔවුන්ගේ මරණ පෙනෙන විදියට සැක සහිතය. වෙඩි හුවමාරුවට ඍජුවම සහභාගි වූ මහජන විමුක්ති ගරිල්ලා හමුදවේ සටන් කරුවන්, කමිටුවට සම්පූර්ණ වාර්තාව ලබා දෙන විට, මේ කම්පිත අත්දැකීම ශ්‍රවණය කිරීමෙන් අපි මුළුමනින්ම විස්මය පත් වීමු. වෙඩි හුවමාරුව සිදුවන විට ඔවුන්ට අධික වෙහෙස, වමනය, හිසරුදව, ආසාත්මිකතාව, හුස්ම ගැනීමේ අපහසුතා සහ ආසාදනය සහ කැස්ස අත් දකින්නට සිදු විය. මුලින් අපි එය දූවිල්ල නිසා ඇති විය හැකිවූ දෙයක් යැයි සිතීමු. නමුත් මැයි 19 වැනි දින එම දිස්ත්‍රික්කයේ ම හෙතාඩ්කාසා ගමේ සටන සිදුවන විට සියළුම මහජන විමුක්ති ගරිල්ලා හමුද සාමාජිකයින්ට හුස්ම පිට කිරීම, උගුරේ ආසාදනයන් සහ ආස්වාශ ප්‍රශ්න වලට සමාන තත්ත්වයන් අත්විඳ තිබුණහ. එම මොහොතේ මහජන විමුක්ති ගරිල්ලා හමුදවේ අණදෙන්නා, මේ ගැන සැලකිල්ලෙන් අවධානය යොමු කළ විට, පොලීසිය අහසෙහි පුපුරන යම් වර්ගයක බෝම්බ විදින බව සහ යම් සුවිශේෂී උණ්ඩ වර්ගයකින් වෙඩි තබන විට මේ තත්වය උද්ගත වන බව වටහා ගත්හ. එම මොහොතේදී ම ගැටුම සිදු නොවන වෙනත් පසෙක වූ, කිසිදු සහෝදරයෙකුට මේ තත්ත්වය අත්දකින්නට නොලැබුණි. මේ සිදුවීමෙන් පසු පොලීසිය රසායනික අවි භාවිතා කරන බව පැහැදිලි වූහ. එය සින්දෙසූර් සිදුවීමේදී පුද්ගලයින් දෙදෙනා ගේ සැකසහිත මරණ පිටුපස වූ සැබෑ හේතුව රසායනික අවි භාවිතය බව අනාවරණය කළහ. මේ සිදුවීමට සම්බන්ධව සිටි සහෝදරවරු, දින ගණනාවක් තිස්සේ හුස්ම ගැනීමේ අපහසුතා ඇති බව දින ගණනාවක් ම පැමිණිලි කළහ. මහජන විමුක්ති හමුදවේ වෛද්‍යවරුන්ගෙන් හොඳ වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමෙන් පසු ඔවුහු යථා තත්ත්වයට පත් වූහ. මහරාෂ්ට්‍රා රජය සමග භජනය පවත්වන ඉන්දීය රජය රසායනික අවි භාවිතා කිරීමට කිසිදු පැකිලීමක් නොදක්වන බව හිරු එළිය සේ පැහැදිලිය. මේ ක්‍රියාව මිනිස් වර්ගයාට ලජ්ජා සහගත දෙයක් පමණක් නොව මිනිස් වර්ගයාට එරෙහි බිහිසුණු ගණයේ අපරාධයකි. රජය කාශ්මීරය, ගිණිකොන පෙදෙස්වල සහ රැලි වලට සහ ඔවුන්ට බාධාකරන කලබලකරුවන්ට එරෙහිව රසායනික අවි භාවිතා කළ යුතුවේ යැයි, කවුරු නම් දනිත්ද? කාට හෝ මේ ගැන අවධානයක් යොමු කරන්න තිබුණේ නම්, එවිට පමණක් ඒවා අනාවරණය වනු ඇත. ජනතාවාදී රසායනික විශේෂඥයන් සහ මානව හිමිකම් ක්‍රියාකාරිකයින් සමග එක්ව ආයුධ තැන්පතු, ගාච්රෝලි පොලිස් කඳවුරේ පතරොම් ගැන විමර්ශනයක් සහ අපක්ෂපාතී පරීෂණයක් සත්‍ය අනාවරණය කර ගැනීමට කළ යුතුම යැයි රටතුළ සහ ලෝකය පුරා යුක්තිය-කැමති මිනිසුන්ගෙන් සහ බුද්ධිමතුන්ගෙන් අපි ඉල්ලා සිටිමු. රසායනික අවි සහ ජන සංහාරක අවි සහිත ඔවුන්ගේ අවි ගබඩා ජනතාවට එරෙහිව රජය ගෙනයන යුද්ධයේ තතු පෙන්වනු ඇත.

මරා දමා එමෙන්ම වැතිරී තිබුණු ලේ පිරුණු දේහ වල ඡායාරූප ගෙන එම සේය රූ ඇතුළත් නමාශීලී බැනර් සකස් කොට භීතියට පත් කිරීමට ඒවා ගම්මාන තුළට දමා සහ ඉහත සියල්ලේම ගාච්රෝලි පොලීසියේ නිළ මුද්‍රාව තබා තිබීම මිනිස් වර්ගයාට නොගැලපෙන නින්දිත වූ හැසිරීමකි. මේ රජයට මිනිස් වර්ගයා ගැන කිසිදු වටිනාකමක් නොමැති බව මේ මානසිකත්වය මහ හඬින් කෑ ගසා කියයි. ඔවුන්ට ආදිවාසීහු වූ කලී දඩයම් කිරීමට තිබෙන වන සතුන් මිස වෙන කිසිවක් නොවන අතර ඔවුහු ඒ ගැන ආඩම්බර වෙති. මෙද්‍රි (Medri) හි දී දිවි පිදූ කාන්තා ක්‍රියාකාරිකයින්ගේ සේයා රූ දිටු විට මිනිස්සු මහ හඬින් හැඬූහ. කිසිදක ව්‍යාපාරයේ කොටසක් නොවූ මිනිසුන්ගේ හදවත් හඬා වැටෙතත් පොලීසිය සහ අමාත්‍යවරු තරු පහේ හෝටල්වල සමරමින් සිටිනු දක්නට ලැබේ. මහාරාෂ්ට්‍රා හි ප්‍රධාන අමාත්‍ය ප්‍රිත්විරාජ් චවාන් සහ ස්වදේශ කටයුතු ඇමති ආර්. ආර්. පටිල් සිය පුරවැසියන් මරා දැමීම වෙනුවෙන් ඔවුන්ට පදක්කම් ලබා දෙනු දක්නට හැකි විය. මේ කොම්ප්‍රදෝරු පාලකයින්ගේ සිංහාසනය මිය ගිය ආදිවාසීන්ගේ මළ කඳන් මත ගොඩ නගා ඇත. මෙය මිනිස් වර්ගයාටම ලජ්ජාවකි.

මුරණ්ඩු ලෙස කථා කළ පොලිස් සුපිරිටැන්ඩන්ට් සුවේෂ් හක් ඔවුන් මිනිසුන්ට වෙඩි තබන බව කිවේය, කුමන ව්‍යවස්ථාවකින් ඔහුට මේ අයිතිය ලබා දී තිබේද? මාඕවාදියෙකුට හෝ වෙන කාට වුවත් සිය පුරවැසියන් මරා දැමීමට අයිතියක් තිබේද? දේශපාලන විරුද්ධවාදීන් ඝාතනය කිරීම මේ රජයේ ප්‍රතිපත්තියයි. දේශපාලනික විරුද්ධත්වය භෞතිකව වැනසීමෙන් අවසන් කරනු ලබයි. මේ ප්‍රජාතන්ත්‍රවාදය නොවේ මධ්‍යතන යුගයේ පාලනයකි. ශ්‍රේෂ්ඨ මිනිසුන් ව්‍යවස්ථාව ලියන ලද්දේ දිළින්දන්ට, අසරණයින්ට, දලිත්, ආදිවාසී සහ පීඩිත මිනිසුන්ට යුක්තිය ලබා දීමේ අරමුණ ඇතිවයි, නමුත් එය ධනවාදී වෙළඳපොලේ නිරුවත් වී ඇත. ආදිවාසීන්ගේ සංවර්ධනය යන මුවාවෙන් ව්‍යවස්ථාවේ 5 වන උපශීර්ෂය යකඩ සපත්තුවලින් පාගා දැමීම ලජ්ජා සහගත බවේ මුදුනටම පත්වීමක් වේ. මෙය ඉන්දියාව පුරාම සිදුවේ. මාඕවාදී නායකත්වය සැලකිල්ලට ගනිමින් තුන් ලක්ෂයකට අධික පොලිස් සහ පැරා මිලිටරි බල ඇණි කලාපය තුළ ජනතාවට කෲරකම් කිරීමට නියෝග දෙනු ලබයි. වනාන්තරය තුළින් ආදිවාසීන් විතැන් කිරීම හෝ ඔවුන්ව ඉමහත් ලෙස බියට පත් කිරීම නිසා සිය ජීවිත ආරක්ෂා කරගැනීම හැර වෙන කිසිම දෙයක් ගැන ඔවුන්ට සිතන්නට නොහැක. ඔවුහු ඔවුන්ගේ ජලය-වනාන්තරය-භූමිය සහ අභිමානය ගැන පවා සිතිය යුතු නැත. මෙවැනි ෆැසිස්ට් ප්‍රහාරයන් රජය විසින් අඛණ්ඩව ගෙන යනු ලබමින් සිටී. මේ ලෝකයේ විශාලතම ප්‍රජාතන්ත්‍රවාදය ද?

ඉන්දියානු කොම්ප්‍රදෝරු පාලකයන් විසින් තෝරා ගෙන තිබෙන අධිරාජ්‍යවාදීන්ගේ නව-ලිබරල් ප්‍රතිපත්ති මේ රට පසුපසට හරවයි. සම්පත් සහ ස්වෛරීත්වය විදේශීය කොම්පැනි වලට මේ වන විටත් විකුණා දමනු ලැබ තිබේ. පරිභෝජනවාදී කොම්ප්‍රදෝරු සංස්කෘතිය රුධිර නාළ වලටද එන්නත් කරමින් පවතී, එහි ප්‍රතිඵලයක් ලෙස කිසිදු ලජ්ජාවකින් තොරව මානව වටිනාකම් සහ සමාජ සිතුම් පැතුම් පොඩිකර දමයි. අතීතය දෙස ආපසු හැරී බැලීමෙන් පසු

පෙනී යන්නේ සමාජයේ එක් කොටසක් පමණක් සංවර්ධනය වී ඇති සෙයකි. මම ඇතිතරම් දියුණුවක් කර තිබේ, මගේ ජීවිතය අනෙක් අයට වඩා හොඳයි, මේ වර්ගයේ සමාජ ඩාවින්වාදයේ බිජුවට වපුරමින් තිබේ. ප්‍රතිඵලයක් ලෙස ආදිවාසීන් සහ දලිත්වරුන් කෙරේ වූ කරුණාව සැතපුම් ගණන් ඈතින් වූ දෙයක් බවට පත්වී තිබේ. අතීතය දෙස හැරී බැලීමේදී, සමහර සම්මානලාභී සමාජ සේවකයින් දුප්පත්කම තුරන් කරලීම උදෙසා වූ සිය NGO හරහා, සම්මාන ඩැහැ ගැනීම සහ මුදල් ඉපැයීමේ ව්‍යාපාර ඇති කිරීම සිදු කළහ. කොයි නිලධාරියාත් ප්‍රජාතන්ත්‍රවාදය තුළ වීරයින් බවට පත් කරන සිය ඝාතන ලකුණු වැඩි කර ගැනීමට වැඩියෙන් ආදිවාසීන් මරයි. රුපියල් කෝටි ගණන් අල්ලස් ගන්නා කොම්ප්‍රදෝරු නායකයෝ විදේශීය සමාගම් වලට රටේ කර්මාන්ත විකුණමින් සිය මඩි පුරවා ගනිති. ජලය, වනාන්තරය සහ භූමිය විකුණා දමා ඇත, සැබෑ අර්ථයෙන් ගත් කළ වනාන්තර නැතුව ආදිවාසීන් නොසිටිනු ඇත, ආදිවාසීන් නොමැතිව වන ගිජු ලිහිණියන්, විවිධ ජීව විශේෂ සුරක්ෂිත නොවනු ඇත. මේ දෙක ආරක්ෂා කර ගැනීම උදෙසා, රජයේ මංකොල්ලයට එරෙහිවීමෙන් සහ සිය ජීවිත පරිත්‍යාගයෙන් එය මැඩ පැවැත්වීමෙන් මාඕවාදී ගරිල්ලෝ චීනයේ ශ්‍රේෂ්ඨ මානව පවුර ඉදි කොට තිබේ. මෙය තරණය කිරීමට රජය අසමත් වී තිබේ.

එම නිසයි රසායනික අවි මගින් කෲර භයානක ප්‍රහාරයන් ජනතාව මතට දියත් කරමින් සිටින්නේ. මේ ප්‍රහාරකයන්ට දඬුවම් කළ යුතුය. මන්මෝහන් සින්, ප්‍රිත්විරාජ් චවාන්, ආර්. ආර්. පටිල් සහ අනෙක් නිලධාරීහු මෙයට සම්බන්ධය. සිය රට වැසියන්ට රසායනික අවි යෙදවීම නිසා මන්මෝහන් සින් අපරාධකරුවෙකි. ඔහු දඬුවම් ලැබීමට සුදුස්සෙකු වන අතර සිරියාව ගැන කතා කිරීමට කිසිදු අයිතියක් නැත. මානව වර්ගයාට එරෙහි ඔවුන්ගේ අපරාධ වෙනුවෙන් ඔවුහු දඬුවම් ලැබිය යුත්තාහ. ලෝක ජනතාවගේ අංක එකේ හතුරා වන ඇමෙරිකාව, කෙසේ හෝ; සිරියාවට එරෙහිව මහ හඬින් හඬ තැලූවද ඉන්දියාවේ මාඕවාදීන්ට එරෙහිව රසායනික අවි භාවිතා කිරීමේ ප්‍රතිපත්තිය ඇමෙරිකාවට වඩා අයිතිය ඇති වෙන කිසිවෙකු නැත. ප්‍රජාතන්ත්‍රවාදය උදෙසා සිරියාවේ ජනතාව සන්නද්ධ අරගලයක නිරතවීම නොබිඳිය හැකි සේම වසර 44 ක් පුරා ඉන්දියාවේ මාඕවාදීහු නව ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් අරගලය ඉදිරියට ගෙන යමින් සිටී. ඔවුහු ඉන්දියාවට තර්ජනයක් වන්නේ කෙසේද? ඔබාමා සහ ඉන්දියානු කොම්ප්‍රදෝරු පාලකයෝ සිය මොළගෙඩි පරීක්ෂා කර ගත යුත්තාහ; කටවල් පමණක් ඇති කලිසම් නොහඳින ඔවුහු ආත්මාර්ථකාමීහු වේ. ඔවුන්ට බිඳක හෝ අවංක බවක් නොමැත; මානව වටිනාකම් ඔවුන්ට කමකට නැත. ජනතාවගේ සංවර්ධනය සහ සුභ සාධනය ඉදිරියට දමමින් ඔවුහු මංකොල්ලකෑමේ සහ මර්ධනය කිරීමේ න්‍යාය පත්‍රය ඉදිරියට ගෙන යයි. හාමත, ලෙඩරෝග, නූගත්කම ආයුධයක් කර ගන්නා ඔවුහු ආර්ථික අර්බුදවලින් ගොඩ ඒමට සත්‍ය ලෙසම මන්මෝහනමික් සහ ඔබාමික් ආකාරයෙන් රේගන්-තැචර්වාදයේ නව-ලිබරල් න්‍යාය ක්‍රියාවට නංවමින් දශ ලක්ෂ ගණන් ජනතාව විනාශයට ඇද දමයි. ජනතාවට එරෙහිව රසායනික අවි භාවිතය මේ ප්‍රතිපත්තියේ ප්‍රධාන අංගයකි. ඔවුන්ව බිමට ඇද දමා දඬුවම් කිරීම දේශප්‍රේමය වනවා මෙන්ම මානව වර්ගයා වෙනුවෙන් කරන ධර්මිෂ්ඨ කර්තව්‍යයකි. එම නිසා, අපි ජනතාවට එරෙහි යුද්ධයට එරෙහිව සහ විශේෂයෙන්ම රසායනික අවි

භාවිතයට එරෙහිව සටන් වැදීමට මානව වර්ගයාට එරෙහි ඔවුන්ගේ අපරාධ සඳහා පාලකයන්ට ජනතා අධිකරණයේදී දඬුවම් කිරීමට තරුණයින්ට, මානවාදීත්වය තවමත් පවතින පුරවැසියන්ට සහ සැබෑ ප්‍රජාතන්ත්‍රවාදය කැමති රටේ ජනතාවට ආමන්ත්‍රණය කරමු.

**ලේකම්**
**සහෝදර සයිහද්‍රි**
**ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය (මාඕවාදී), මහාරාෂ්ට්‍රා ප්‍රාන්ත කමිටුව**

***MRL*** පරිවර්තනයකි

Blog: http://liberationbase.wordpress.com/
E-mail: slradical@ymail.com